

Freedom from Torture

සාරාංශය

# ඉතා කුඩා වෙනස:

## ශ්‍රී ලංකාවේ ආරක්ෂාව පිළිබඳ මෙහෙයුමේ අඛණ්ඩව පවතින වධහිංසාව

2019 ජනවාරි

# සාරාංශය

වධ හිංසා පැමිණවීම සම්බන්ධයෙන් ප්‍රතිපත්තිය වන “අවම ඉවසීම” සම්බන්ධයෙන් නව රජයේ පොරොන්දුව නොතකා ශ්‍රී ලංකාවේ ආරක්ෂාව පිළිබඳ පවත්වාගෙන යන මෙහෙයුම ඇතුලත් සංදර්භයේදී ෆ්‍රීඩම් ෆ්‍රම් ටෝර්චර් (Freedom from Torture) මගින් වධහිංසා පැමිණවීම අඛණ්ඩව සිදුවන බව සොයාගෙන ඇත.

මෙම සංක්ෂිප්ත වාර්තාව මගින් 2015 සහ 2017 අතර කාලය තුළ රඳවා තබන ලද සහ වධහිංසා පමුණුවන ලද ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් Freedom from Torture විසින් සකස් කරන ලද වෛද්‍ය -නීති වාර්තා 16 ක් විභාග කෙරේ.

අපගේ නඩු කට්ටලයේ රඳවා තබන ලද සහ වධහිංසා පමුණුවන ල ද සියලු දෙනා ද්‍රවිඩ ජාතිකයන්ය. ඒ අතරින් ඉලක්ක කරන ලද සහ රඳවා තබන ලද බොහෝ දෙනාල වර්තමානයේ කිසිම සම්බන්ධතාවයක් නොමැති බවට හෙළි කළ ද යුද්ධයට පසුව ඊනියා “පුනරුදයේ” කොටසක් වශයෙන් හෝ යුද්ධයට පසුව යටත් වීමෙන් ද්‍රවිඩ ඊලාම් විමුක්ති කොටි සංවිධානයට (LTTE) අඛණ්ඩව මැදිහත් වූ බවට රාජ්‍ය බලධාරීන් විසින් චෝදනා කරනු ලැබූ අය වූහ. ආණ්ඩු විරෝධී කටයුතුවලට සම්බන්ධ වූ අය ද ඉලක්ක කර ගත්හ. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ හෝ වෙනත් ඕනෑම නීතිමය විධිවිධාන යටතේ කිසිවෙක් නිල වශයෙන් චෝදනා කරන නොලදී.

සිව් දෙනෙකු කොළඹ දී අත්අඩංගුවට පත් වුවද බොහෝ දෙනෙකු උතුරු පලාතේ දිස්ත්‍රික්කවලදී අත්අඩංගුවට ගෙන රඳවා තැබූ අය වූහ. සියලු නඩුවලදී, LTTE හෝ රාජ්‍ය විරෝධී ක්‍රියා සම්බන්ධයෙන් තොරතුරු ලබාගැනීමට හෝ පාපොච්චාරණය කිරීමට රාජ්‍ය නිලධාරීහු වධහිංසා පැමිණවීම භාවිත කළහ. සියලු දෙනා විවිධ උපකරණවලින් පහරදීම, පිළිස්සීම, ස්ථානීය වධ හිංසා සහ හුස්ම හිරකිරීම මෙන්ම තර්ජනය කිරීම සහ ලැජ්ජාවට පත්කිරීම ඇතුලුව ශාරීරික සහ මානසික වධහිංසාව අත්වින්දහ. අඩකට වඩා අයව දූෂණය කරන ලද අතර ලිංගික වධහිංසා පැමිණවූ බවට බොහෝ දෙනා හෙළි කළහ.

සංහිඳියාව සඳහා අත්‍යාවශ්‍ය වගකීම සහ මානව අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම 2015 දී, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ රජය විසින් පොරොන්දු විය. පුළුල් මානව හිමිකම් ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රයක සම්බන්ධයෙන් කිසියම් ප්‍රගතියක් ශ්‍රී ලංකාව ලබා ඇත. අතුරුදන් පුද්ගලයන් සම්බන්ධයෙන් කාර්යාලයක් පිහිටුවීම සහ එක්සත් ජාතීන්ගේ විශේෂ යාන්ත්‍රණ විසින් පැමිණ කරන පරීක්ෂාවන් කීපයකට ඉඩදීම මෙයට අයත් විය.

කෙසේ වෙතත්, මෙම පියවරයන් මගින් ශ්‍රී ලංකාවේ සංහිඳියාව වගකීම සහ මානව අයිතිවාසිකම් ප්‍රවර්ධනයට එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය (UN Human Rights Council) සඳහා 2015 සැප්තැම්බර් මස රජය විසින් දරණ ලද වගකීම් පහත දමා ඇත. වධ හිංසාව දිගටම පාවිච්චි කිරීම යනු ශ්‍රී ලංකාව දිගටම තමන්ගේ පොරොන්දු කඩ කරන බවට පැහැදිලි උදාහරණයකි.

ශ්‍රී ලංකාවේ වදහිංසාවෙන් බේරී සිටින අය විසින් දිගින් දිගටම උල්ලංඝනය කිරීම්, යුක්තිය හා වගකීම්වල අසාර්ථකත්වයත්, ප්‍රතිසන්ධාන ප්‍රයත්නයන් වලක්වාලමින් දඬුවම් නොලබා සිටීමේ සංස්කෘතියත් දකිති.

2018 අග භාගයේ දී ශ්‍රී ලංකාව තුළ දිගහැරුණු දේශපාලන හා ව්‍යවස්ථාමය අර්බුදය, වගවීමේ ක්‍රියාවලීන් සඳහා කැප වූ සභාග ආණ්ඩුවේ අස්ථාවරත්වය පෙන්නුම් කරන ලද අතර, යම් ප්‍රගතියක් ආපසු හැරවිය හැකි ආකාරය නිරූපනය කරන ලදී.

2015 දී එකඟ වූ සහ 2017 දී අලුත් කරන ලද යෝජනාව අනුව 2019 මාර්තු මාසයේ දී, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය විසින් ශ්‍රී ලංකාව කෙරෙහි අවධානය යොමු කිරීම පවත්වාගෙන යන්නේ ද යන්න තීරණය කරනු ඇත. මෙම සාකච්ඡාවේ දී, වසර හතරකට පෙර බාරගත් කැපවීම මත රජය විසින් සිදු කරන ලද මන්දගාමී ප්‍රගතිය එක්ව දැනට සිදු කෙරෙමින් පවතින ජාත්‍යන්තර නිරීක්ෂණ හා අධීක්ෂනය සඳහා අවශ්‍ය වන බලවේගය ප්‍රබල බව සාක්ෂි දරයි. Freedom from Torture විශ්වාස කරන්නේ මානව හිමිකම් කවුන්සිලයේ වරපසාදයක් මගින් නවීන ජාත්‍යන්තර පරීක්ෂණයක් සහ සහාය ඇති කිරීම, ප්‍රතිසංස්කරණය, සංහිඳියාව සහ වගවීම ප්‍රගතිය, බරපතල ඇඟවුම් සහිතව අත්පත් කර නොගන්නා බවට වගබලා ගැනීමයි.

ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වාචික සහතික වලින් ඔබ්බට ගමන් කළ යුතු අතර, වගවීම සම්බන්ධයෙන් සිය පුරවැසියන්ට හා ජාත්‍යන්තර ප්‍රජාවට දුන් ප්‍රතිඥාවන් ක්‍රියාවට නැංවීම සඳහා කාලෝචිත බැඳීම් සඳහා එකඟ විය යුතුය.

# නිර්දේශ

## ශ්‍රී ලංකා රජයට:

ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන් හා දේශීය නීති සම්පාදනය කිරීමේ සිය වගකීම් සම්බන්ධයෙන් රජය විසින් පහත ආකාරයෙන් ඉටුකළ යුතුය:

1. පහත සඳහන් දෑ මගින් වධහිංසා පිළිබඳ සිය 'ශුන්‍ය ඉවසීමේ' ප්‍රතිපත්තිය යථාර්තයක් බවට පත් කිරීම:

   (i) වධහිංසා පැමිණවීම පිළිබඳ චෝදනා සහ අපරාධ විමර්ශන ආරම්භ කිරීම සහ වගකිවයුත්තන්ට වගකිව යුත්තන් කුමන බලවේග හෝ ජ්‍යෙෂ්ඨයන් රජයේ හෝ මිලිටරි, ප්‍රතිපත්ති හා ආරක්ෂක සේවාවන්හි වගකිව යුතු අයගේ රාජකාරි අත්හිටුවීම;

   (ii) ශුන්‍ය නොවන ඉවසීමේ ප්‍රතිපත්තිය විස්තර කරමින් රට පුරා ප්‍රචාරක කටයුතු ආරම්භ කිරීම සහ පුනරුත්ථාපනය සහ වගකීම යාගත හැකි අයුරු ගැන තොරතුරු සැපයීම.

2. අත්අඩංගුවට ගන්නා ඕනෑම අයකුට පහත දෑ ඇතුලත්ව හැකියාව ඇති බව සහතික කිරීම:

   (i) ඔවුනේග් තේරීම අනුව නීතිමය නියෝජනය සහ ස්වාධීන වෛද්‍ය පරීක්ෂාවට කඩිනම් ප්‍රවේශය;

   (ii) නිල නොවන රැඳවුම් මධ්‍යස්ථාන ඇතුලුව ඕනෑම රැඳවියෙකු ජාත්‍යන්තර වශයෙන් පිළිගන්නා අපරාධයකට චෝදනා ලබා නොමැති නම් හෝ ජාත්‍යන්තර ප්‍රමිති අනුව සාධාරණ නඩුවිභාගයකට පසුව සිර දඬුවමක් ලැබූ පසු ඔහුව නිදහස් කිරීමට; සහ

   (iii) පාපෝච්චාරණයෙන් සහ වෙනත් වධහිංසා තුලින් ලබාගත් වෙනත් සාක්ෂිවල පාපෝච්චාරන සියලු තත්වයනේගන් ඉවත් කිරීම

3. රට තුළ කාර්යක්ෂම ආකාරයෙන් සිය වරම දිය හැකි බව සහතික කිරීම සඳහා ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසම සභාවට ප්‍රමාණවත් අරමුදල් සපයා ඇති බව සහතික කිරීම.

4. ක්‍රියාත්මක කිරීම සඳහා පැහැදිලි කාල රාමුවක් ඇතුලත් නැවත අලුත් කරන ලද මානව හිමිකම් සභා තීරණයක් තුලින් සංහිඳයාව, වගවීම සහ මානව හිමිකම් ප්‍රවර්ධනයට ඇති වගකීම නැවත සහතික කිරිම.

## ජාත්‍යන්තර ප්‍රජාවට:

එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් විසින් පහත සඳහන් පරිදි කටයුතු කළ යුතුය:

1. වධහිංසා පැමිණවීම ඇතුලුව මානව හිමිකම් උල්ලංඝණය පිළිබඳව ගැටලු ශ්‍රී ලංකාව රජය සමග සියලු ද්විපාර්ශවික සහ බහු පාර්ශවික මානව හිමිකම් සාකච්ඡාවලදී පෙන්වා දෙන බව සහතික කිරීම සහ ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන් සහ එහි ව්‍යවස්ථාව යටතේ එහි යුතුකම ඉටුකිරීමට උනන්දු කිරීම.
2. විශේෂයෙන් අඛණ්ඩ දේශපාලන අස්ථාවර සංදර්භයක් තුල ප්‍රතිසංස්කරයන් නිසා ඇතිවූ ප්‍රගතිය සහතික කිරිමට නැවත අලුත් කරන ලද මානව හිමිකම් කවුන්සිලයේ බලතල තුලින් ශ්‍රී ලංකා රජයට අඛණ්ඩ සහයෝගය සහ පරීක්ෂාව පවත්වාගැනීම.
3. විශ්ව සාධාරණත්වය යටතට ගැනෙන මානව හිතවාදය, යුද අපරාධ, වධ හිංසා සහ බලහත්කාරයෙන් අතුරුදන්කිරීම් පිළිබඳ අපරාධ කිරීම සම්බන්ධයෙන් සැක කරන රජයේ නිලධාරියෙකු හෝ LTTE සාමාජිකයකු වන ඕනෑම ශ්‍රී ලාංකිකයකු පිළිබඳව විමර්ශනය කොට නීතිමය පියවර ගත යුතු ය.

## FREEDOM FROM TORTURE

Freedom from Torture යනු වධහිංසා වලින් පසුව ජීවත්වන පුද්ගලයන්ට ප්‍රතිකාර කිරීමට සහ පුනරුත්ථාපනය කිරීමට ඇපකැප වී සිටින එක්සත් රාජධානිය පදනම් වූ මානව හිමිකම් සංවිධානයකි. මානසික සහ ශාරීරික චිකිත්සාවන්, වධහිංසා සම්බන්ධයෙන් අධිකරණ වාර්තා, නීතිමය සහ සුභ සාධන උපදෙස් සහ නිර්මාණශීලි ව්‍යාපෘති ඇතුලත්ව වර්ෂයකට එංගලන්තය සහ ස්කොට්ලන්තය දක්වා වධහිංසාවලට ගොදුරව ජීවත්වන 1,000 කට පමණ අප විසින් සේවා සපයනු ලැබේ.

අප ලොව විශාලතම ප්‍රතිකාර මධ්‍යස්ථානවලින් එකක් වන අතර 1985 වර්ෂයේ අප සංවිධානය ආරම්භයේ සිට වධහිංසාවලට ගොදුරව ජීවත්වන 60,000 කට වඩා අප වෙත යොමුකර ඇත. අපගේ විශේෂඥ සායනිකයන් විසින් සකස් කරන ලද වෛද්‍ය-නීති වාර්තා ජාත්‍යන්තර ආරක්ෂාව සහ වධහිංසා සිදුකරන රාජ්‍යයන් සැලකිල්ලට ගැනීමට අරමුණු කොට වධහිංසාවලට ගොදුරුව පසුව ජීවත් වන්නනේග් සාක්ෂි සඳහා භාවිතා කෙරේ.

අපගේ වධහිංසා සම්බන්ධයෙන් කැපවූ වැඩසටහන අතරින් අප, වධහිංසාව වලක්වාලීම ශක්තිමත් කිරීමට අපගේ උත්සාහයන්ට උපකාරවීමට, යුක්තිය ආරක්ෂා කිරිමට සහ වධහිංසාවලට ගොදුරුව පසුව ජීවත් වන පුද්ගලයන් සඳහා ජාත්‍යන්තර ආරක්ෂාව සහතික කිරීමට සේවය කරමු. වධහිංසාවලින් පසුව ජීවත්වන්නනේග් හඬ සහ විශේෂඥ ඥානය මෙම සේවයේ මූලික අරමුණ තුල ඇත.

අප, අපගේ ආයතනික විශේෂඥ සායනිකයනේගන් ලබාගත් සාක්ෂි ක්‍රමානුකූලව භාවිත කරන සහ අප සේවය කරන වධහිංසාවලින් පසුව ජීවත් වන පුද්ගලයන් වධහිංසාවලින් තොර ලොවක් කරා සේවය කිරීමට සිටින එකම මානව හිමිකම් සංවිධානය වේ.

Freedom from Torture

# ඉතා කුඩා වෙනසක්:

## ශ්‍රී ලංකාවේ ආරක්ෂාව සම්බන්ධ මෙහෙයුම්වලදී දිගටම ක්‍රියාත්මක වධහිංසා පැමිණවීම

කරුණාකර Freedom from Torture සම්බන්ධයෙන් වැඩි විස්තර ලබාගැනීමට
www.freedomfromtorture.org ට යොමුවන්න.

අපගේ ට්විටර් ගිණුම Twitter @FreefromTorture

එසේ නොමැති නම් අපගේ ෆේස් බුක් අඩවියට පිවිසෙන්න
Facebook https//www.facebook.com/FreedomfromTorture

Freedom from Torture
111 Isledon Road, London, N7 7JW.
Tel: 020 7697 7777
Fax: 020 7697 7799

Please visit our website to find out more:
www.freedomfromtorture.org

ලියාපදිංචි පුණ්‍යායතනය: England 1000340, Scotland SC039632.
ආගමන සේවා කොමසාරිස් කාර්යාලය (Office of the Immigration Services Commissioner) ලියාපදිංචි අංකය: N201600022.